# කාර්ය පත්‍රිකාව

**1. පන්තිය** - 6 ශ්‍රේණිය **විෂය** - පෙරදිග සංගීතය **අදාල සතිය** - ඔක්තෝබර් 2වන සතිය

**2. පාඩම හෝ ඒකකය** - 7.1 රිද්ම රටා ප්‍රස්ථාර කිරීම.

**3. මෙම සතිය තුළ නියමිත පාඩම් තුළින් ලබාගත යුතු ඉගැනුම් ඵල.**

- රිද්මය විවිධ රටාවන් සහිත බව ප්‍රකාශ කරයි.
- මාත්‍රා 2,3,4 ආදී වශයෙන් බෙදෙන බව පවසයි.
- නැවතීම් හා ඇදීම් අනුව විවිධ රටා බිහිවන බව පිළිගනී.
- විවිධ රිද්ම රටා නිර්මාණය කරයි.
- රිද්ම රටා අනුව අත්තැලීම හෝ භාණ්ඩයකට තට්ටු කිරීම කරයි.
-

**4. ශිෂ්‍යයා කළ යුතු කාරීයන්.**

- එදිනෙදා කරීයන් කිරීමේදී යම්කිසි රිද්මයක් ඇති බව හඳුනාගැනීමට යොමු කිරීම.
- ගුරුවරයා විසින් මේසයට තට්ටු කර වයන ලද රිද්ම රටා හොඳින් අධ්‍යනය කිරීමට යොමු කිරීම
- පරිසරයෙන් සපයාගත් ආදේශ භාණ්ඩ ( පොල්කටු, ලී කැබලි....) වලින් රිද්ම රටා වාදනයට යොමු කිරීම.
- අත්තැලීමෙන් රිද්මරටා ප්‍රගුණ කිරීම.
- තම්මැට්ටම, ගැටබෙරය භාණ්ඩ වලින් වාදනය කරන රිද්ම රටා හඳුනාගැනීමට යොමු කිරීම.
- මාත්‍රා 2x2 රිද්මය, 3x3 සහා 4x4 රිද්ම රටා ප්‍රස්ථාර කිරීමට යොමු කිරීම.
    i . X X I X X I X X I X X I
    ii. X X X I X X X I X X X I X X X I
    iii. X X X X I X X X X I X X X X I X X X X I
- කණ්ඩායම් වශයෙන් වාදනය කළ විවිධ රිද්ම රටා ප්‍රස්ථාර කිරීමට යොමු කිරීම.
- ගුරුවරයා වාදනය කරන ගීතයට අනුව අත්තැලීමට යොමු කිරීම.
-

**5. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත්, website ආදී ආධාරක.**

- පරිසරයෙන් සපයාගත හැකි ඉහතින් සඳහන් සරල උපකරණ.
- ගුරුමාර්ගෝපසංග්‍රහය පිටු 80,81,82 .
- ජනකබණ්ඩාර මහතාගේ 6 ශ්‍රේණිය සංගීත වැඩා පොත පිටු 81,82 .
- Youtube (NAADRO තලාවාදන ප්‍රසංග).

  1.https://youtu.be/jE7Z8hDF6Cw

  2.https://youtu.be/P8w2Xs5Koi8

**6. ඇගයීම / තක්සේරුකරණය.**

පහත සඳහන් ගීපද පේළි සඳහා සුදුසු රිද්ම රටාව යොදා ප්‍රස්ථාර කරන්න.

1) කිරිසුදු හාවා

   පැන පැන ආවා

2) සවන පිනන ගීත මිහිර
3) ප්‍රධාන රිද්ම රටා 3න අසුරු කරගෙන එකකට එක රිද්ම රටාව බැගින් නිර්මාණය කරන්න.